# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2203/39 - 2020 නොවැම්බර් මස 28 වැනි සෙනසුරාදා - 2020.11.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත**

25 (1) වගන්තිය යටතේ කෙරෙන නියෝගය

1984 අංක 07 දරන පනතින් හා 1984 අංක 35 සහ 1992 අංක 2 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 25 (1) වගන්තිය යටතේ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

නියෝගය

2020 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 2195/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මෙම කරුණට අදළව පළකරන ලද නියෝගයෙහි අංක 01 සිට 03 දක්වා වූ උපලේඛන වෙනුවට පහත දැක්වෙන අංක 01 සිට 03 දක්වා වූ අලුත් උපලේඛන මගින් ආදේශ කිරීමෙන් එම නියෝගය සංශෝධනය කරනු ලබන අතර, එකී උපලේඛනවල සඳහන් බිම් කොටස් ඉහත සඳහන් පනත මගින් පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන ශ්‍රී ලංකා වරාය අධිකාරියට එහි ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය බැවින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගෙන, එම පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 25 (1) වගන්තිය ප්‍රකාරව මෙම නියෝගය මගින් අනුමත කරමි.

**පී. රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

1A - G 33255 — 30 (2020/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛන අංක 01**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක J/233 දරන කන්කසන්තුරේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් කන්කසන්තුරේ බටහිර ගමේ පිහිටි එස්. ආර්. ඉලේපෙරුමාච්චි, බලයලත් මිනින්දෝරු විසින් 2020.08.11 වැනි දින මැන සාදන ලද අංක S/Mis/510A පිඹුරු පතින් සවිස්තරව සඳහන් ව ඇති ඉඩම් කැබලි අංක 01 හි මායිම්, උතුරට : මුහුද දිගේ වෙන් කළ බිම ද, නැගෙනහිරට : කැබලි අංක 02 සහ කෝවිල ද, දකුණට : කෝවිල සහ පාර (නා.සං.අ.) සහ බටහිරට : ජැටිය සඳහා වෙන් කරන ලද පාරට ද මායිම් වූ හෙක්ටයාර් 6.536 හෝ අක්කර 16 පර්චස් 24ක (අ. 16, රූ. 0, පර්. 24) වපසරියකින් යුත් ඉඩම.

**උපලේඛන අංක 02**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක J/233 දරන කන්කසන්තුරේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයට සහ අංක J/234 දරන කන්කසන්තුරේ මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් කන්කසන්තුරේ බටහිර ගම්වල පිහිටි එස්. ආර්. ඉලේපෙරුමාච්චි, බලයලත් මිනින්දෝරු විසින් 2020.08.11 වැනි දින මැන සාදන ලද අංක S/Mis/510A පිඹුරු පතින් සවිස්තරව සඳහන් ව ඇති ඉඩම් කැබලි අංක 02 හි මායිම්, උතුරට : මුහුද දිගේ වෙන් කළ බිම හා කැබලි අංක 03 ද, නැගෙනහිරට : මුහුද දිගේ වෙන්කළ බිම හා ශ්‍රී ලංකා රේගුවට අයත් ඉඩම ද, දකුණට : පාර (නා.සං.අ.) ද බටහිරට : කෝවිල සහ කැබලි අංක 01 බිම් කැබැල්ලට මායිම් වූ හෙක්ටයාර් 13.333 හෝ අක්කර 32 රූඩ් 03 පර්චස් 31ක (අ. 32, රූ. 03, පර්. 31) වපසරියකින් යුත් ඉඩම.

**උපලේඛන අංක 03**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක J/234 දරන කන්කසන්තුරේ මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් කන්කසන්තුරේ ගමේ පිහිටි එස්. ආර්. ඉලේපෙරුමාච්චි, බලයලත් මිනින්දෝරු විසින් 2020.08.11 වැනි දින මැන සාදන ලද අංක S/Mis/510A පිඹුරු පතින් සවිස්තරව සඳහන් ව ඇති ඉඩම් කැබලි අංක 03 හි මායිම්, උතුරට : මුහුද දිගේ වෙන් කළ බිම, නැගෙනහිරට : කැබලි අංක 02 සහ ශ්‍රී ලංකා රේගුවට අයත් ඉඩම ද, දකුණට : කැබලි අංක 02 ද, බටහිරට : මුහුද දිගේ වෙන් කළ බිම ද මායිම් වූ හෙක්ටයාර් 0.371 හෝ රූඩ් 03 පර්චස් 26ක (අ. 0, රූ. 03, පර්. 26) වපසරියකින් යුත් ඉඩම.

12 - 190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.